# ඇබෑර්තු

## නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
### රජය සතු විශාලතම අලෙවිසැල් ජාලය සඳහා

## මූල්‍ය

**සුදුසුකම් (පහත සඳහන් 01 හෝ 02)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ ගණකාධිකරණය/ මූල්‍ය කළමනාකරණය/ වාණිජ්‍ය / පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම.

   සහ

   තනතුරට අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් (Masters') හෝ තනතුරට අදාළ ක්ෂේත්‍රයක වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

   සහ

   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ ප්‍රසිද්ධ පුද්ගලික ආයතනයක සනාථ කළ සේවා වාර්තාවක්

   සමග

   කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්ද සහ ඉන් වසර පහක් (05) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

2. තනතුරට අදාළ ක්ෂේත්‍රයක වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය (Full Membership) ලබා තිබීම.

   සහ

   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ ප්‍රසිද්ධ පුද්ගලික ආයතනයක සනාථ කළ සේවා වාර්තාවක්

   සමග

   කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්ද සහ ඉන් වසර පහක් (05) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

## අභ්‍යන්තර විගණන

**සුදුසුකම් (පහත සඳහන් 01 හෝ 02)**

1. ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් පිළිගත් මූල්‍ය කළමනාකරණය/ ගණකාධිකරණය/ වාණිජ්‍යය පිළිබඳ උපාධියක්

   සමග

   අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් (මීඩීඒ)

   සමග

   සංස්ථාවක, රජයේ වෙනත් ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් කළමනාකරුවෙකු ලෙස අවුරුදු 15ක් සේවය කර තිබීම හා ඉන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 5ක් සේවය කර තිබීම හා එම කාලය තුළ ප්‍රගතිය සනාථ කිරීමේ වාර්තා ඉදිරිපත් කිරීමේ හැකියාව.

2. තනතුරේ ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක සාමාජික සාමාජිකත්වය (fellow membership) CIMA, ACCA, CA, CIA)

   සමග

   සංස්ථාවක, රජයේ වෙනත් ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් කළමනාකරුවෙකු ලෙස අවුරුදු 15ක් සේවය කර තිබීම හා ඉන් ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික කළමනාකරුවෙකු ලෙස වසර 5ක් සේවය කර තිබීම හා එම කාලය තුළ ප්‍රගතිය සනාථ කිරීමේ වාර්තා ඉදිරිපත් කිරීමේ හැකියාව.

## මානව සම්පත් හා පරිපාලන

**සුදුසුකම් (පහත සඳහන් 01 හෝ 02)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය / රාජ්‍ය කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය / නීතිය පිළිබඳ උපාධියක්.

   සමග

   අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (Masters') සුදුසුකම

   සහ

   අවම වශයෙන් අවුරුදු 15 ක සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක සනාථ කළ ඇගයුම් වාර්තාවක් සහිතව කළමනාකරන මට්ටමින් සේවය කර ඉන් වසර 05 ක් "ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමින්" සේවය කර තිබීම.

2. තනතුරට අදාළ ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය

   සමග

   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමින්" අවම වශයෙන් අවුරුදු 15 ක පළපුරුද්දක් ඇති ඉන් වසර 5 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද, සනාථ කළ ඇගයුම් වාර්තාවක් සහිතව තිබිය යුතුය.

## ප්‍රසම්පාදන

**සුදුසුකම් (පහත සඳහන් 01 හෝ 02)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ අලෙවිකරණය, ව්‍යාපාර කළමනාකරණය හෝ වාණිජ විෂය පිළිබඳ ප්‍රථම උපාධියක්,

   සහ

   අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් (මීඩීඒ) හෝ තනතුරට අදාළ ක්ෂේත්‍රයක පිළිගනු ලැබූ වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත (ද්‍රජ්වීඩ) හෝ පූර්ණ (තමතක) සාමාජිකත්වය ලබා තිබීම.

   සහ

   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ ප්‍රසිද්ධ පුද්ගලික ආයතනයක සනාථ කළ සේවා වාර්තාවක් සමග කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) සේවා පළපුරුද්දක් තිබීම සහ ඉන් වසර (05) පහක් ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ සේවා පළපුරුද්දක් වීම.

2. තනතුරට අදාළ ක්ෂේත්‍රයක පිළිගනු ලැබූ වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ (Full) සාමාජිකත්වය.

   සහ

   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ ප්‍රසිද්ධ පුද්ගලික ආයතනයක සනාථ කළ සේවා වාර්තාවක් සමග කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්දක් තිබීම සහ ඉන් වසර (05) පහක් ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ සේවා පළපුරුද්දක් වීම.

**වයස :** අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 60 ට නොවැඩි විය යුතුය.

**වැටුප් සහ අනෙකුත් දීමනා :**

මූලික වැටුප : රු. 150,000/- (කාර්ය සාධන දීමනාව : රු.75,000/- , ප්‍රවාහන දීමනාව රු. 50,000/-.
තනතුරට අනුමත මාසික ඉන්ධන දීමනාව සහ සන්නිවේදන දීමනාව රජයේ චක්‍රලේඛ වලට අදාළව)

**පත්වීමේ ස්වභාවය :** කොන්ත්‍රාත් තනතුරකි. සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට හිමිකම් ඇත.

**අයදුම්කරු සතුව :**

- දත්ත ඇගයීමට, සමාලෝචනය කිරීමට, අර්ථ නිරූපණය කිරීමට සහ උසස් ස්වයං අභිප්‍රේරණයක් ඇති පුද්ගලයෙකු විය යුතු අතර, විශ්ලේෂණාත්මකව ගැටළු විසඳීමේ සහ සංවිධානය කිරීමේ විශිෂ්ඨ කුසලතාවයන් තිබිය යුතුය.
- ශක්තිමත් නායකත්ව ගුණාංග සහ අන්තර් පුද්ගල සන්නිවේදන කුසලතා තිබිය යුතුය.
- තොරතුරු තාක්ෂණය හැකියාවන්ගෙන් විශිෂ්ඨයෙකු විය යුතුය.
- බහු විධ කණ්ඩායම් වලට නායකත්වය ලබා දීමේ හා මෙහෙය වීමේ හැකියාවන්ගෙන් හෙබි අයෙකු විය යුතුය.
- මීට ඉහතදී පිළිගත් වාණිජ හෝ බහු ජාතික සමාගම්හි ලබා ඇති රාජකාරි පළපුරුද්ද සම්බන්ධයෙන් අපගේ විශේෂ අවධානය යොමු කෙරේ.

**සෑම අයදුම්කරුවෙකුම,**

- ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
- තනතුරේ රාජකාරි මනාව ඉටුකිරීම සඳහා සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරික හා මානසික තත්ත්වයකින් හෙබි විය යුතුය.
- විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

ඔබ ඉහතින් සඳහන් සුදුසුකම් සපුරා ඇති අයෙක් නම් , ඔබගේ ජීවදත්ත පත්‍රිකාව හා සහතික පත්‍රයන්හි පිටපත් මෙම දැන්වීම පළවී දින 10ක් ඇතුළත ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට හෝ අපගේ **vacancies@lankasathosa.org** යන විද්‍යුත් තැපෑල වෙත යොමු කිරීමට කටයුතු කරන්න. (ඉල්ලුම් කරනු ලබන තනතුර ලිපි කවරයෙහි වම් පස ඉහල කෙළවරෙහි / විද්‍යුත් තැපැල් පණිවුඩයෙහි '**Subject**' හිරුසෙහි සඳහන් කළ යුතුය.)

(ආයතනය ලිපි ගනුදෙනු කරනුයේ සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගන්නා ලද අයදුම්කරුවන් සමග පමණක් බව සළකන්න.)

වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

**සභාපති,**
**ලංකා සතොස ලිමිටඩ්, සතොස මහලේකම් ගොඩනැගිල්ල,**
**අංක 27, 05 වන මහළ, චෝක්ෂෝල් වීදිය, කොළඹ 02**